## තල් සංවර්ධන මණ්ඩලය - 2017

----------------------------------

තල් සංවර්ධන මණ්ඩලයේ (“මණ්ඩලය”) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 44 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 අගෝස්තු 13 දින මණ්ඩලයේ සභාපති වෙත නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 දෙසැම්බර් 31 දිනට තල් සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වීම (ශ්‍රී ලං රා ගි ප්‍ර)

ශ්‍රී ලං රා ගි ප්‍ර 07 - දේපල, පිරියත හා උපකරණ: පෙර වර්ෂවලදී මිලදීගත් පිරිවැය රු.22,395,067 ක් වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම් මණ්ඩලය විසින් එම වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය යළි තක්සේරු කිරීමකින් තොරව හා ඒ අනුව ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදීත් අඛණ්ඩව භාවිතා කරමින් පැවතුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

තෙවන පාර්ශව 09 දෙනෙකුගෙන් අයකර ගැනීමෙන් තොරව එකතුව රු.4,894,325 ක් වූ ලැබිය යුතු ශේෂ වර්ෂ 03 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ඒ සඳහා හානිකරණ ප්‍රතිපාදනයක් සිදුකර නොතිබුණි.

### 2.3 ගෙවිය යුතු ගිණුම්

වර්ෂ 03 කට වැඩි කාලයක් ගිණුම්වල පැවති එකතුව රු.248,885 ක් වූ ගෙවිය යුතු ණයවලට අදාළව විධිමත් විමර්ශනයක් කිරීමෙන් පසු නිරවුල් කිරීමට හෝ සුදුසු ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| i මුදල් රෙගුලාසි 110 | පාඩු හා හානිවලට අදාළ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වා නොතිබුණි. |
| ii මුදල් රෙගුලාසි 135 | මණ්ඩලයේ සභාපති විසින් මූල්‍ය බලතල පවරා |

නොතිබුණි.

iii මුදල් රෙගුලාසි 445, 715 හා 751

i මණ්ඩලයට අයත් දිස්ත්‍රික් කාර්යාල හා මධ්‍යස්ථාන විසින් ලැබීම්, නිකුත් කිරීම් හා ඉදිරියට ගෙන යන ලද ශේෂ පැහැදිලිව දැක්වෙන පරිදි අප්‍රමාදීව ඉන්වෙන්ට්‍රි ලේඛනය පවත්වා නොතිබුණු අතර විධිමත් ගබඩා පරිපාටි අනුගමනය කර නොතිබුණි.

ii පෙර වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දෙන ලද ඌනතාවයන්, අතිරික්තයන් හා වෙනත් නිරීක්ෂණ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ආ) **2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය**

4.2.5 ඡේදය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලදී පහත සඳහන් ප්‍රකාශන මාසික පදනමින් සමාලෝචනය කිරීම මගින් මණ්ඩලය විසින් එහි කාරක ප්‍රාග්ධනය පිළිබඳ ඵලදායී කළමනාකරණය සඳහා පද්ධති සකස් කර නොතිබුණි.

(i) ණයගැතියන් හා ණයහිමියන් පිළිබඳ කාල විශ්ලේෂණය
(ii) තොග පිළිබඳ කාල විශ්ලේෂණය
(iii) පැරණි, සෙමින් චලනය වන හා යල්පැන ගිය තොග හා වෙනත් විෂයයන් හඳුනාගැනීමේ ප්‍රකාශන

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ වැඩ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.131,952,115 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.128,597,258 ක් වූයෙන් මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.3,354,857 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. රු.8,739,881 කින් සංවර්ධන වියදම හා පුහුණු වියදම වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.මිලියන 131.95 ක ඌනතාවයක් වුවද, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයෙන් රටට වන දායකය රු.මිලියන 208.91 ක් විය. තවද, සමාලෝචිත වර්ෂය සඳහා පුද්ගල පඩිනඩි හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයට එකතු කළ අගය රු.මිලියන 76.96 ක් විය.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ මුළු මෙහෙයුම් වියදම රු.181,303,559 ක් වුවද ඉන් රු.123,078,150 ක් හෙවත් සියයට 67 ක් පුද්ගලික පඩිනඩි සඳහා දරන ලද වියදමින් නියෝජනය විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා දළ ලාභය ගණනය කිරීමේදී කර්මාන්ත මධ්‍යස්ථානවල සේවක පිරිවැය අය නොකිරීම හේතුවෙන් පෙර වර්ෂයේ සියයට 19 සිට සමාලෝචිත වර්ෂයේ සියයට 27 දක්වා මණ්ඩලයේ දළ ලාභ ආන්තිකය වැඩි වී තිබුණි.

(ඇ) කර්මාන්ත මධ්‍යස්ථානවල දළ ලාභය සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ සේවක පිරිවැයෙන් සියයට 09 ක් පමණක් ආවරණය කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය එහි නිෂ්පාදන මට්ටම් වැඩි කිරීම මඟින් හා විවිධ වර්ගයේ තල් නිෂ්පාදන එනම්, පැණි, පැණිරස රා, සීනි සූකිරි, බෝතල් රා, විනාකිරි, බෝතල් කළ පල්ප, පන්නාඩු, පැණි පන්නාඩු, ජෑම්, කෝඩියල්, බීමට සුදානම් පානයන්, ඖෂධ පදනම් නිෂ්පාදන, ටියුබර් (නැවුම්) වේලන ලද ටියුබර්, වේලන ලද ටියුබර් පිටි, තම්බන ලද ටියුබර් පිටි, පාම්පෝෂ, බිස්කට්, කේක් වර්ග, සාම්ප්‍රදායික අත්කම්, වියන ලද කූඩ, වියන ලද පුටු, කජු ඇසිරීම සඳහා පෙට්ටි, තේ සහ කුළු බඩු, තොප්පි, පැදුරු, කොසු, ටූත් ප්‍රික්ස්, ස්කිව් ස්ටික්ස් ආදී ඉරටු නිෂ්පාදන, මල් පෝච්චි, සැරසිලි භාණ්ඩ, බිත්ති හැන්ගර්, ගෙවතු වගා සඳහා මල් කොහු කුඩු වර්ධන මාධ්‍යක් ලෙස, පසේ ලුණු පාලනය, තද කොහු, තද බුරුසු, මධ්‍යම කොහු පිරිසිදු කිරීමේ හා ගෘහාශ්‍රිත බුරුසු, මෘදු කොසු, කෙඳි, කොහු අත්කම්, ඉදිකිරීමේ කාර්යයන්, ගෘහ භාණ්ඩ සෑදීම, විජ බෝඩ් ඇදීම හා ඉන්ධන දර සැදීම යනාදි විවිධ තල් නිෂ්පාදන සඳහා වෙළඳපොල වැඩි කිරීම මගින් ජාතික ආර්ථික වර්ධනයට, සෞඛ්‍ය සම්පන්න සමාජයක් හා ඝන අපද්‍රව්‍ය ගැටළු අඩු කරගැනීමට දායකත්වය සැපයීම සඳහා වන එහි ප්‍රධාන අරමුණු ඉටුකරගැනීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි.

(ආ) හකුරු නිෂ්පාදනය පල්ප නිෂ්පාදනය හා කෙඳි නිෂ්පාදනය සම්බන්ධයෙන් 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මේ දක්වා ඇති ඇතැම් ඉලක්කයන් සපුරා ගෙන නොතිබුණි.

(ඇ) යැපුම් තත්ත්වයේ පවුල්වල ජීවනෝපාය සංවර්ධනය කිරීමේ අරමුණ සඳහා තල් අත්කම් සහ සම්බන්ධිත නිෂ්පාදන අපනයනය කිරීම සඳහා මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

## 4.2 මෙහෙයුම් දුර්වලතා

### 4.2.1 තික්කම් ස්කාගාර ව්‍යාපෘතිය මෙහෙයවීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වදමරච්චි තල් සංවර්ධන සමුපකාර සමිති පොකුරු ව්‍යාපෘතිය සමඟ එළඹී ගිවිසුමේ 01 හා 02 ඡේද ප්‍රකාරව, එම ව්‍යාපෘතියෙන් 2008 මැයි මාසයේ සිට අයවිය යුතු රු.1,609,453 ක මාසික රාජ්‍ය භාගය හා බදු කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයෙන් පසු ක්‍රියාත්මක නොවූ තික්කම් ස්කාගාරය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් 2016 හා 2017 වර්ෂයන්හිදී පිළිවෙලින් රු.මිලියන 112.5 ක් හා රු.මිලියන 150 ක් වූ ප්‍රතිපාදන සලසා තිබුණි. කෙසේ වුවද ඉහත ප්‍රතිපාදන උපයෝජනය කර ස්කාගාරයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට 2018 සැප්තැම්බර් 26 දින දක්වා කටයුතු කර නොතිබුණි.

### 4.2.2 පාඩු පිට පවත්වා ගෙන යන ආදර්ශ ගොවිපොළවල්

ආදර්ශ ගොවිපොළවල් 04 ක් පසුගිය වර්ෂ 05 ක් සඳහා අඛණ්ඩව පාඩු ලබමින් පවත්වා ගෙන ගොස් තිබූ අතර සමාලෝචිත වර්ෂය හා පසුගිය වර්ෂ 04 ක් තුළ දරන ලද පාඩු පහත දැක්වේ.

| ආදර්ශ ගොවිපොළේ නම | වර්ෂ සඳහා ශුද්ධ පාඩුව | | | | |
|---|---|---|---|---|---|
| | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
| | රු. | රු. | රු. | රු. | රු. |
| කුඩදනයි | 259,108 | 276,556 | 688,821 | 545,045 | 462,273 |
| මන්මුනෙයි | 411,543 | 452,418 | 608,282 | 694,221 | 571,755 |
| ඩෙල්ෆ්ට් | 2,168 | 56,828 | 60,000 | 61,620 | 380,044 |
| පුලියන්කුලම | 830,097 | 2,283,204 | 2,383,310 | 1,771,618 | 700,423 |
| ශුද්ධ පාඩුව | 1,502,916 | 3,069,006 | 3,740,413 | 3,072,504 | 2,114,495 |

තවද මුළු වපසරිය අක්කර 137 ක් වූ ඉඩම්වල පිහිටි මන්මුනෙයි, අරිවියල් නගර්, ඕටුපුලම්, මුලන්කවිල් යන තවත් ආදර්ශ ගොවිපලවල් 04 ක් ඒවායේ කටයුතු 2010 වර්ෂයේ සිට ආරම්භ කර නොතිබුණි.

### 4.2.3 තල් පර්යේෂණ ආයතනය පිළිබඳ මෙහෙයුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 සිට 2017 කාල පරිච්ඡේදය තුළ පර්යේෂණ කාර්යයන් සිදු කිරීම සඳහා රු.මිලියන 74 ක මුදලක් වැයකර තිබුණද, එම පර්යේෂණ කාර්යයන් වලින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් හෝ තල් වගා ප්‍රජාව ප්‍රතිලාභ ලබා නොතිබුණි.

(ආ) පර්යේෂණ යෝජනා අනුමත කිරීම සඳහා විද්‍යාත්මක ඇගයීම් ක්‍රමවේදයක් නොතිබුණි.

(ඇ) රටේ පොලිතීන් භාවිතය අඩුකරලීමේ අරමුණින් විකල්ප හා ආකර්ශනීය අත්කම් නිෂ්පාදන හඳුන්වාදීම සඳහා පර්යේෂකයින් ඔවුන්ගේ අවධානය යොමු කර නොතිබුණි.

**4.2.4 කට්පහම් විකුණුම් මධ්‍යස්ථාන ක්‍රියාකාරීත්වය**

---

උපාය මාර්ගික වෙළඳපොළ සැලසුම් හා විධිමත් නියාමන පද්ධතියක් නොමැතිව කට්පහම් විකුණුම් මධ්‍යස්ථාන මෙහෙයවීම හේතුවෙන් කට්පහම් විකුණුම් මධ්‍යස්ථාන 02 ක් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.119,880 ක පාඩුවක් සහිතව ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

**4.3 කොන්ත්‍රාත් පරිපාලනය**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මණ්ඩලය සඳහා නිෂ්පාදන මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.4,122,497 ක මුදලක් වැය කර තිබුණු අතර එය 2017 පෙබරවාරි හෝ ඊට පෙර නිමකළ යුතු විය. කෙසේ වුවද, දින 337 ක ප්‍රමාදයකින් පසුව වැඩවලින් සියයට 90 ක් පමණක් නිම කර 2018 පෙබරවාරි 23 දින එය මණ්ඩලයට භාරදී තිබුණි. තවද, ප්‍රමාදය සඳහා ප්‍රමාණ කළ අලාභද කොන්ත්‍රාත්කරු සඳහා පනවා නොතිබුණි.

(ආ) කයිතඩිහි තල් පිළිබඳ පාසැල සඳහා මහල් 02 ක ගොඩනැගිල්ලක් ඉදිකිරීමට බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් රු.මිලියන 25 ක මුදලක් මුදා හැර තිබුණි. කෙසේ වුවද, අත්තිවාරම් සඳහා මුල්ගල තැබීම හැර සමාලෝචිත වර්ෂය තුළ ඉදිකිරීම් කටයුතු සිදුකර නොතිබුණි.

**4.4 අවිධිමත් ගනුදෙනු**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2011 වර්ෂය තුල ස්ථිර පදනම මත මණ්ඩලයේ අභ්‍යන්තර විගණක බඳවා ගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුල රු.55,671 ක මාසික වැටුපක් ඔහුට ගෙවා තිබුණි. ඊට අමතරව 2017 වර්ෂයේදී එකතුව රු.128,448 ක වෙනත් දීමනා ඔහුට ගෙවා තිබුණි. එසේම මණ්ඩලය දැනුවත් කිරීමකින් තොරව හා අදාළ බලධාරීන්ගෙන් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් තොරව මෙම කාලපරිච්ඡේදය තුළදීම ඔහු විසින් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක ලෙස කටයුතු කර තිබුණි.

විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, 2017 අගෝස්තු 01 දින සිට 2018 ජූලි 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය වෙත ලබාදෙන ලද සේවය වෙනුවෙන් විශ්වවිද්‍යාලයෙන් රු.600,000 ක වැටුපක් ඔහු විසින් ලබා ගෙන තිබුණි. තවද, සාවද්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීම මගින් රු.72,000 ක මුදලක් ගමන් වියදම් ලෙස ලබා ගෙන තිබුණි.

(ආ) බඳවාගැනීමේ හා උසස්වීම් පරිපාටියේ විධිවිධානවලට පටහැනිව මණ්ඩලයේ නිලධාරීන් 08 දෙනෙකුට එකතුව රු.4,280,600 ක් වූ වැටුප් වර්ධක ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත

නිලධාරීන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට රු.627,577 ක අතිරේක දායකයක් සිදු කර තිබුණි.

**4.5 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරන ලදී.

(අ) ස්ථිර පදනමකින් පුරප්පාඩු පිරවීමට කටයුතු කිරීමෙන් තොරව ප්‍රාථමික මට්ටමේ අනියම් සේවකයන් දෙදෙනෙකුගේ සේවය අඛණ්ඩව ලබාගෙන තිබූ අතර ප්‍රාථමික මට්ටමේ අතිරික්ත සේවකයන් 10 දෙනෙකු සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නෙතිබුණි.

(ආ) මණ්ඩලයේ විවිධ තනතුරු දරා සිටින නිලධාරීන් 212 දෙනෙකු සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග පවත්වා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2018 සැප්තැම්බර් 26 වන විටත් ඔවුන්ගේ සේවාවන් ස්ථිර කර නොතිබුණි. තවද, එම නිලධාරීන්ගේ අධ්‍යාපනික සුදුසුකම් පසුගිය වර්ෂ 12 කට වැඩි කාලයක් අදාළ ආයතනවලින් තහවුරු කර ගෙන නොතිබුණි.

(ඇ) බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය 2012 වර්ෂයේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර තිබුණද, පවත්නා සේවක සංඛ්‍යාව විධිමත් කිරීමට හා එම පරිපාටියට අනුව වැටුප් ගෙවීමට විධිමත් පියවරක් ගෙන නොතිබුණි.

**4.6 මෝටර් වාහන උපයෝජනය**

------------------------------

ලැන්ඩ් මාස්ටර් 05 ක්, මෝටර් කාර් එකක්, ජීප් රථයක්, යතුරු පැදියක්, ට්‍රැක්ටරයක් හා බවුසරයක් අලුත්වැඩියා කිරීමට හා මණ්ඩලයේ කටයුතුවලට යොදා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.7 තිරසාර සංවර්ධනය**

---------------------

2030 වර්ෂය සඳහා තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් නොවීම හේතුවෙන් මණ්ඩලයේ කාර්යයන්ට අදාළ එම අරමුණු හා ඉලක්ක හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

--------------------------------------------

**5.1 අභ්‍යන්තර විගණනය**

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය ආරම්භයේදී මණ්ඩලයේ අභ්‍යන්තර විගණන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) කාර්තුමය අභ්‍යන්තර විගණන වාර්තා හා විගණන විමසුම්වල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සෑම වර්ෂයකම රුපියල් මිලියන ගණනක් පර්යේෂණ කාර්යයන් සඳහා වැය කර තිබුණද, තල් පර්යේෂණ ආයතනයේ ඉදිකිරීම් වැඩ හා කාර්යයන් අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය කර නොතිබුණි.

## 5.2 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම

2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව වගකීම් ප්‍රකාශයක් නොමැතිව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 5.3 විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්

2005 ජූලි 01 දිනැති අංක පීඊඩී/31 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව සෑම වර්ෂයකම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04 ක් හෝ පැවැත්විය යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 5.4 ප්‍රසම්පාදන හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව වර්ෂය ආරම්භයේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5.5 අයවැය ලේඛනමය පාලනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම සහ වියදම අතර සියයට 06 සිට සියයට 129 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) අයවැය ලේඛනයේ ප්‍රතිපාදන නොමැතිව මෝටර් වාහන, ලී බඩු හා උපකරණ, ගොඩනැගිලි, යන්ත්‍ර හා උපකරණ, රසායනාගාර පරීක්ෂණ උපකරණ හා පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර ප්‍රසම්පාදනය සඳහා රු.65,873,000 ක මුදලක් වැයකර තිබුණි.

## 5.6 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 හා 2016 වර්ෂය සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර නිකුත්කරන ලද මාගේ විස්තරාත්මක වාර්තාව මඟින් මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. ස්ථාවර වත්කම් පාලනය හා තල් පර්යේෂණ ආයතනයේ පර්යේෂණ නිමැවුම් පිළිබඳව විශේෂ අවධානය යොමු විය යුතු වේ.